SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2025 ජනවාරි

යෝජිත උත්තර

(301) මූල්‍ය වාර්තාකරණය (FAR)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය 2025 ජනවාරි

(301) මූල්‍ය වාර්තාකරණය

යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 4 (මුළු ලකුණු 20)	**A කොටස**

පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 01-පාලන ව්‍යුහය, ගිණුම්කරණයේ දී ආචාරධර්මවල ඇති වැදගත්කම සහ මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව

(a)

1. ඩිජිටල් තාක්ෂණයේ විකාශනය හා ස්වයංක්‍රීයකරණය
2. ගෝලීයකරණය
3. හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන් සහ වාර්තා කිරීමේ ප්‍රමිතීන්හි වෙනස්කම්
4. නව නියාමන අවශ්‍යතා.
5. කොටස්කරුවන්ගේ අපේක්ෂාවන්හි වෙනස්කම්.
   උදා-:තිරසාරත්ව වාර්තාකරණය හා සහ ESG හෙළිදරව් කිරීම්
6. ව්‍යාපාර සංකීර්ණත්වය
7. දුරස්ථ ශ්‍රම බලකාය
8. සංකලිත වාර්තාකරණය

(ලකුණු 03 යි)

(b)

1. ඓතිහාසික පිරිවැය
2. සාධාරණ වටිනාකම
3. වර්තමාන වටිනාකම
4. භාවිත අගය/ සම්පුර්ණ කිරීමේ අගය/ ඉෂ්ඨ කිරීමේ අගය (Value in use and fulfilment value)
5. ප්‍රවර්තන පිරිවැය

(ලකුණු 02 යි)
(මුළු ලකුණු 05)

දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 01-පාලන ව්‍යුහය, ගිණුම්කරණයේ දී ආචාරධර්මවල ඇති වැදගත්කම සහ මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව

(a)

තිරසාර වාර්තාකරණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ සංවිධානයක පාරිසරික, සමාජීය සහ පාලන (ESG) කාර්ය සාධනය පිළිබඳ විනිවිද පෙනෙන සහ සවිස්තරාත්මක තොරතුරු කොටස්කරුවන්ට ලබා දීමයි. එය මූල්‍ය කාර්ය සාධනය සමඟ මූල්‍ය නොවන අංශ හෙළි කිරීමෙන් සංවිධානයේ දිගුකාලීන වටිනාකම් නිර්මාණය, පාරිසරික බලපෑම සහ සමාජ වගකීම තක්සේරු කිරීමට උපකාරී වේ.

(ලකුණු 02 යි)

(b)

- උපායමාර්ගික අවධානය සහ අනාගත දිශානතිය
- තොරතුරු සම්බන්ධතාවය
- ප්‍රමාණාත්මක බව
- කොටස්කරුවන්ගේ සබඳතා.
- සංක්ෂිප්ත බව
- විශ්වසනීයත්වය සහ සම්පූර්ණත්වය
- අනුකූලතාව සහ සංසන්දනය

(ලකුණු 03 යි)
(මුළු ලකුණු 05)

තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 04 - මූල්‍ය හා මූල්‍ය නොවන දත්ත හා තොරතුරු අර්ථ දැක්වීම

(a)

<u>දළ ලාභ අනුපාතය</u>

- විකුණුම් මිල වැඩිකිරීම
- සැපයුම්කරුවන් සමග සිදු කරන මිල කේවල් කිරීම මගින් විකුණුම් භාණ්ඩවල පිරිවැය අඩුකර ගැනීම
- තොග වශයෙන් මිලදී ගැනීම,
- නිෂ්පාදන කාර්යක්ෂමතාව ඇතිකිරීම

<u>ණයගැති එකතු කිරීමේ කාලය:</u>

දැඩි ණය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
කල් ඉකුත් වූ ඉන්වොයිසි පිළිබඳ දැඩි අවධානය යොමු (පසු විපරම්) කිරීම
කලින් පියවන ණය සඳහා වට්ටම් ලබා දීම

(ලකුණු 02 යි)

aat SRI LANKA

(b)

1. මූල්‍යප්‍රකාශන වල ඇතුලත් තොරතුරු ඓතිහාසික පිරිවැය සංකල්පය මත පදනම් වන අතර වෙළඳපල තුල උද්ධමනයේ බලපෑම සැලකිල්ලට නොගැනීම
2. අතීත ආර්ථික තත්වය, ව්‍යාපාර පරිසරය හා අභ්‍යන්තර සාධක එක ලෙස දිගටම නොපවතින බව නොසලකා අතීත දත්ත මත පදනම්ව ගණනය කරන ලද අනුපාත ඇසුරින් අනාගතය පිළිබඳ තීරණ ගැනීම.
3. සමහර අනුපාතයන් ගණනයේදී මූල්‍යවාර්තාකරණ දිනට පැවති තත්වය හා සංඛ්‍යා මත පදනම්ව ගණනය කිරීම. කෙසේ වෙතත්, එකී අගයන් වසර පුරාම එක ලෙස නොපවතී.
4. ව්‍යාපාර අතර අනුපාතයන් සංසන්දනයේදී එම ව්‍යාපාර අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් පැවතීම නිසා සංසන්දනය කිරීම අපහසු වේ
5. හිතාමතා සිදුකරණු ලබන වංචාසහගත වෙනස් කිරීම (මූල්‍ය වාර්තා බාහිර ආකර්ෂණය/Window dressing) මූල්‍ය ප්‍රකාශන තුලින් නිරූපණය විය හැකි බව
6. විවිධ කර්මාන්තයන් අතර අනුපාත සැලකිය යුතු වෙනස්කම් පෙන්වන බැවින් විවිධ ක්ෂේත්‍ර වල ආයතන අතර සැසඳීම අපහසු වීම
7. වෙළඳපල තත්ත්වයන්, කළමනාකරණ කාර්යක්ෂමතාව සහ වෙළඳනාම කීර්තිය වැනි මූල්‍ය නොවන අංශ අනුපාත විශ්ලේෂණයේදී අදාල කර නොගනී.

(ලකුණු 03 යි)

(මුළු ලකුණු 05)

හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02 කොටස II) - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව භාවිත කිරීමේ හා ඒවා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්

1. **වෙළඳපල සමීක්ෂණ පිරිවැය (රු.මිලියන 2)**

• පැහැදිලි කිරීම: LKAS 38 ට අනුව, පර්යේෂණ අවධියේදී දරන ලද පිරිවැය වියදම් වන අතර අස්පෘශ්‍ය වත්කමක් ලෙස ප්‍රාග්ධනීකරණය කළ නොහැක. වෙළඳපල පර්යේෂණ, පර්යේෂණ අවධියේ කොටසක් ලෙස සලකනු ලබන අතර ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා වන අනාගත ආර්ථික ප්‍රතිලාභ නිර්ණායක සපුරාලන්නේ නැත.

නිගමනය: අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත නොහැක.

2. **පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීමේ පිරිවැය** (රු. 75,000)

• පැහැදිලි කිරීම: පේටන්ට් බලපත්‍ර වැනි නෛතික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා සෘජුවම අදාල වන පිරිවැය, හඳුනාගැනීමේ හැකියාව සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමේ හැකියාව යන නිර්ණායක සපුරාලන බැවින්, LKAS 38 මගින් අස්පෘශ්‍ය වත්කමක් ලෙස පිළිගනී.

• **නිගමනය**: අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත හැක.

3. **කළමනාකරුවන් සඳහා පුහුණු පිරිවැය (රු. මිලියන 10)**

• පැහැදිලි කිරීම: පුහුණුවත් සමඟ සේවකයින්ගේ කාර්ය සාධනය වැඩි වේ

නිගමනය: අස්පෘශ්‍ය වත්කමක් ලෙස **හඳුනාගත නොහැක.**

SRI LANKA

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

අනිවාර්ය ප්‍රශ්න 3

(මුළු ලකුණු 30)

B කොටස

පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 03 (2 කොටස) - ප්‍රසිද්ධ කිරීම සඳහා වූ සීමිත වගකීමක් සහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

සීමිත සූර්යා පෞද්ගලික සමාගම
2024/3/31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	
බදු පෙර ලාභය (පෙරවැඩ 01)	3,450,000
+/- ගැලපුම්	
ක්ෂය වීම් [2900-(2400-700)]	1,200,000
පාරිතෝශික වෙන් කිරීම්	120,000
ඉවත් කිරීමේ ලාභය	(200,000)
පොලී වියදම	1,000,000
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	**5,570,000**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම	
තොග වැඩි වීම	(11,800,000)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම	12,865,000
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ අඩුවීම	(2,420,000)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**4,215,000**
පාරිතෝශික ගෙවීම	(80,000)
ආදායම් බදු ගෙවීම්	(870,000)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,265,000**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	
දේපල පිරියත උපකරණ මිලට ගැනීම	(2,100,000)
දේපල පිරියත උපකරණ ඉවත් කිරීමෙන් ලැබුණු මුදල්	200,000
ආයෝජන කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,900,000)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	
ගෙවූ ණය	(2,600,000)
දිගුකාලීණ ණය ලබා ගැනීම	2,000,000
ගෙවූ ණය පොලිය	(685,000)
ලාභාංශ ගෙවීම	(230,000)
මූල්‍ය කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,515,000)**
කාලච්ඡේදය මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස් වීම	(150,000)

aat SRI LANKA

ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ	2,200,000
2024 මාර්තු 31 දිනට අවසන් මුදල් හා මුදල් සමාන දෑ	**2,050,000**

පෙරවැඩ 01 -බදු පෙර ලාභය

බදු පෙර ලාභය	2,730,000
ආදායම් බදු	720,000
බදු පසු ලාභය	3,450,000

පෙරවැඩ 02

දිගුකාලීන ණය ගිණුම

මුදල්	2,600,000	ඉ/ගෙ/ශේෂය	6,000,000
		ණය ලබා ගැනීම /මුදල්	2,000,000
ප/ගෙ/ශේෂය	5,400,000		
	8,000,000		**8,000,000**

පෙරවැඩ 03

දේපල පිරියත හා උපකරණ

ඉ/ගෙ/ශේෂය	20,100,000	ඉවත් කිරීම්	700,000
මුදල්	2,100,000	ප/ගෙ/ශේෂය	21,500,000
	22,200,000		**22,200,000**

SRI LANKA

පාරිතෝෂික වෙන්කිරීම

මුදල්	80,000	ඉ/ගෙ/ශේෂය	350,000
		පාරිතෝෂික(ලා/ලා)	120,000
ප/ගෙ/ශේෂය	390,000		
	470,000		**470,000**

ගෙවිය යුතු පොලී වියදම් ගිණුම

මුදල්	685,000	ඉ/ගෙ/ශේෂය	120,000
		ලා/ලා	1,000,000
ප/ගෙ/ශේෂය	435,000		
	1,120,000		**1,120,000**

රඳවාගත් ඉපැයුම් ගිණුම

මුදල්	230,000	ඉ/ගෙ/ශේෂය	4,100,000
		ලා/ලා	2,730,000
ප/ගෙ/ශේෂය	6,600,000		
	6,830,000		**6,830,000**

දේ.පි.උපකරණ ඉවත්කිරීමේ ගිණුම

පිරිවැය	700,000	සමුච්චිත ක්ෂය	700,000
		මුදල්	200,000
ලා/ලා	200,000		
	900,000		**900,000**

ගෙවිය යුතු ආදායම් බදු ගිණුම

මුදල්	870,000	ඉ/ගෙ/ශේෂය	150,000
		ලා/ලා	720,000
	870,000		**870,000**

සමුච්චිත ක්ෂය

ඉවත් කිරීම්	700,000	ඉ/ගෙ/ශේෂය	2,400,000
		ලා/ලා	1,200,000
ප/ගෙ/ශේෂය	2,900,000		
	3,600,000		**3,600,000**

aat SRI LANKA

(මුළු ලකුණු 10)

හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02.10 කොටස 2.16 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව භාවිත කිරීමේ හා ඒවා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්

(a)

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ යනු ආයතනයක් විසින් තම සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ වන අතර, සේවකයින් අදාළ සේවාව සපයන කාලය අවසන් වීමෙන් පසු මාස 12ක් ඇතුළත ඒවා ගෙවිය යුතුය.

උදාහරණ:

- වැටුප් සහ වේතන: මාස 12ක් ඇතුළත ගෙවිය යුතු අතිකාල සහ ප්‍රසාද දීමනා ඇතුළුව සේවකයින්ට ඔවුන්ගේ සේවාවන් සඳහා නිතිපතා කරන ගෙවීම්.
- ගෙවන ලද වාර්ෂික නිවාඩු සහ අසනීප නිවාඩු: ඉදිරි මාස 12 තුළ භාවිතා කිරීමට අපේක්ෂා කරන නිවාඩු (නිවාඩු හෝ අසනීප නිවාඩු) සඳහා හිමිකම්.
- ගෙවන ලද මාතෘ / පීතෘ නිවාඩු
- වත්මන් සේවකයින් සඳහා ලෙඩ නිවාඩු, නිවාස, මෝටර් රථ සහ ගිනි රක්ෂණ හෝ සහනාධාර භාණ්ඩ හා සේවා වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ.

(ලකුණු 04)

(b)
(i)

ලැබිය යුතු කල්බදු ගිණුම

තොග විකුණුම්	6,800,000	මුදල්	2,000,000
නොඉපයූ ආදායම්	**2,874,670**	මුදල්	1,534,934
		ප/ගෙ/ශේෂය	6,139,736
	9,674,670		**9,674,670**

(ii)

නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම

පොලී ආදායම (ලා/ලා)	864,000	ලැබිය යුතු කල්බදු	2,874,670
ප/ගෙ/ශේෂය	2,010,670		
	2,874,670		**2,874,670**

පෙරවැඩ:
දළ ආයෝජනය (1,534,934 x 5) + 2,000,000 = 9,674,670

වර්ෂය	ඉ/ගෙ/ශේෂය	වාරිකය	පොලිය	ප්‍රාග්ධන කොටස	ප/ගෙ/ශේෂය
1	4,800,000	1,534,934	864,000	670,934	4,129,066
2	4,129,066	1,534,934	742,232	791,702	3,337,363
3	3,337,364	1,534,934	600,725	934,208	2,403,155
4	2,403,155	1,534,934	432,568	1,102,366	1,300,789
5	1,300,789	1,534,934	234,142	1,300,790	-

හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02.13 කොටස 2.11 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව භාවිත කිරීමේ හා ඒවා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්

(a)

1) රු.1,000,000 වන්දි ඉල්ලා ගනුදෙනුකරුවකු විසින් ගොනුකරන ලද නඩුව

- **විශ්ලේෂණය:**
  LKAS 37 ට අනුව, ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබන්නේ:

  - අතීත සිදුවීම් හේතුවෙන් වර්තමාන බැඳීමක් තිබේ නම්.
  - ආර්ථික සම්පත් පිටතට ගලා යාමක් තිබේ නම්.
  - වටිනාකම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි නම්

මෙම සිද්ධියේදී සමාගමේ නීතිඥවරයා පවසන්නේ මෙහි වන්දි ගෙවීමේ සම්භාවිතාව අඩු බවයි. ඒ අනුව මෙහි ප්‍රතිපාදනයක් හදුනාගැනීමේ නිර්ණායක සපුරා නැති බව ප්‍රකාශ වේ.

ගෙවීමට ඇති අඩු සම්භාවිතාවයේ තක්සේරුවත් සමඟ හිමිකම් පෑමේ ස්වභාවය සහ ප්‍රමාණය

පැහැදිලි කරමින් මෙය මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල අසම්භාව්‍ය වගකීමක් ලෙස හෙළිදරව් කළ යුතුය.

2) 2024 අප්‍රේල් 10 වන දින අවසාන ලාභාංශ ප්‍රකාශ කිරීම

- **විශ්ලේෂණය:**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු ප්‍රකාශයට පත්කරන ලද ලාභාංශ 2024 මාර්තු 31 දිනට පැවති තත්වයට බලපාන්නේ නැති බැවින් LKAS 10 (වාර්තාකරන කාලච්ඡේදයෙන් පසු සිදුවීම්) අනුව නොගලපන සිදුවීමක් වේ.

2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍යප්‍රකාශන වල කිසිදු වගකීමක් හෝ ප්‍රතිපාදනයක් හඳුනාගැනීම අවශ්‍ය නොවේ. නමුත් එය සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කල යුතුවේ.

3) ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉඩ නොදුන් රුපියල් මිලියන 1.5ක වියදම්

- **විශ්ලේෂණය:**

අඩුකිරීමට ඉඩ නොදුන් රුපියල් මිලියන 1.5 ක වියදම් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායමට බලපායි, නමුත් බදු තක්සේරුව 2024 අප්‍රේල් 30 වන දින අවසන් කරන ලදී. මෙම සිදුවීම වසර අවසාන බදු වියදම සහ වගකීම අඩුවෙන් දක්වා ඇති බවට සාක්ෂි සපයන අතර, එය LKAS 10 ප්‍රමිතියට අනුව ගැලපුම් කල යුතුවේ.

බදු බලපෑම ගණනය කිරීම
රුපියල් මිලියන 1.5 ක ඉඩ නොදුන් වියදම අමතර බදු අය කළ හැකි ආදායමක් ඇති කරයි. 30% ක ආයතනික බදු අනුපාතයක් උපකල්පනය කළහොත්:

අමතර බදු වගකීම =1,500,000×30%=450,000

2024/3/31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල රු,450,000ක අමතර ආදායම් බදු වගකීමක් හඳුනාගෙන බදු වියදම සඳහා ආදායම් වැඩිවීම ගැලපුම් කල යුතුවේ.

(ලකුණු 05)

(b)

i.“සුදුසුකම් ලත් වත්කමක්” යනු එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට අනිවාර්යයෙන්ම සැලකිය යුතු කාලයක් ගතවන වත්කමකි.

සුදුසුකම් ලත් වත්කම් සඳහා උදාහරණ:

- ගොඩනැගිල්ලක් හෝ නිෂ්පාදන කම්හලක් ඉදිකිරීම
- මහාමාර්ග, පාලම් හෝ බලාගාර වැනි යටිතල පහසුකම් ව්‍යාපෘති
- දිගු සංවර්ධන කාලයක් අවශ්‍ය වන විශාල නිෂ්පාදන පේලි හෝ අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද මෘදුකාංග
- තොග
- අස්පෘශ්‍ය වත්කම්
- ආයෝජන දේපල
- ධාරක වෘක්ෂ (Bearer Plants)

(ලකුණු 03)

ii. ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය ආරම්භ කිරීමේ කොන්දේසි:

LKAS 23 ට අනුව, ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය ආරම්භ වන්නේ:

- සුදුසුකම් ලත් වත්කම මත වියදම් දැරීම
- ණයගැනීම මත පිරිවැය දැරීම
- වත්කම එහි අපේක්ෂිත පරිහරණය හෝ විකිණීම සඳහා පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකරමින් සිටීම යන අවස්ථාවලදීය

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 03 (1 කොටස)- ප්‍රසිද්ධ කිරීම සඳහා වූ සීමිත වගකීමක් සහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

(a)

සීමා සහිත SAFE WHEEL පොදු සමාගමේ
2024/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

රු.

අයභාරය	**1**		317,000,000
(-)විකුණුම් පිරිවැය	**2**		(161,000,000)
දළ ලාභය			**156,000,000**
අනෙකුත් ආදායම්	**3**		18,280,000
(-) වියදම්			
පරිපාලන වියදම්	**4**	(77,420,000)	
බෙදාහැරීමේ වියදම්	**5**	(36,400,000)	
මූල්‍ය වියදම්	**6**	(2,375,000)	(116,195,000)
බදු පෙර ලාභය			**58,085,000**
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
අනෙකුත් වියදම් -හානිකරණ අලාභ	**7**	(2,000,000)	
වර්ෂය සඳහා ලාභය			**56,085,000**
ආදායම් බදු වියදම			(12,450,000)
බදු පසු ලාභය			**43,635,000**
අනෙකුත් විස්තීර්ණ ආදායම්			-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්			**43,635,000**

(ලකුණු 10)

(b)

සීමා සහිත SAFE WHEEL පොදු සමාගමේ
2024/03/31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ			146,030,000
ප්‍රාග්ධන නොනිමි වැඩ			100,625,000
මුළු ජංගම නොවන වත්කම්			**246,655,000**
ජංගම වත්කම්			
තොගය		94,000,000	
වෙළඳ ලැබිය යුතු දෑ		87,780,000	
ලැබිය යුතු පොලී		250,000	

ඉදිරියට කල ගෙවීම්		2,700,000	
අතැති මුදල්		38,000,000	
මුළු ජංගම වත්කම්			**222,730,000**
මුළු වත්කම්			**469,385,000**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධන		300,000,000	
රඳවාගත් ඉපැයුම්		79,635,000	
මුළු හිමිකම			**379,635,000**
ජංගම නොවන වගකීම්			
දිගුකාලීන ණය	**8**	40,000,000	
මුළු ජංගම නොවන වගකීම්			**40,000,000**
ජංගම වගකීම්			
දිගුකාලීන ණය	**8**	10,000,000	
බැංකු අයිරාව		12,000,000	
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ		24,000,000	
උපචිත වියදම් (800,000 + 500,000)		1,300,000	
උපචිත ආදායම් බදු		2,450,000	
මුළු ජංගම වගකීම්			**49,750,000**
මුළු හිමිකම් හා වගකීම්			**469,385,000**

(ලකුණු 08)

(c)

සීමා සහිත SAFE WHEEL පොදු සමාගමේ
2024/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	**රඳවාගත් ඉපැයුම්**	**මුළු හිමිකම**
			Rs.
2023/04/01 දිනට ආරම්භක ශේෂය	300,000,000	51,000,000	351,000,000
වර්ෂය සඳහා ලාභය	-	43,635,000	43,635,000
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-
අතුරු ලාභාංශ ගෙවීම		(15,000,000)	(15,000,000)
2024/03/31 දිනට අවසන් ශේෂය	**300,000,000**	**79,635,000**	**379,635,000**

(ලකුණු 03)

(d)

දේපල පිරියත හා උපකරණ: **Rs.**

අයිතමය	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර	මෝටර් රථ	එකතුව
2023/04/01 දිනට පිරිවැය	90,000,000	36,000,000	60,000,000	12,000,000	**198,000,000**
ඉවත් කිරීම	-	-	-	**(6,000,000)**	**(6,000,000)**
හානිකරණය			(2,000,000)		**(2,000,000)**
2024/03/31 දිනට පිරිවැය	**90,000,000**	**36,000,000**	**58,000,000**	**6,000,000**	**190,000,000**
2023/04/01 දිනට **සමුච්චිත ක්ෂය**	-	15,000,000	18,000,000	5,000,000	**38,000,000**
වාර්ෂික ක්ෂය	-	720,000	6,000,000	3,000,000	**9,720,000**
ඉවත් කිරීම	-	-	-	**(3,750,000)**	**(3,750,000)**
2024/03/31 දිනට සමුච්චිත ක්ෂය	**-**	**15,720,000**	**24,000,000**	**4,250,000**	**43,220,000**
2024/03/31 දිනට ධාරණ අගය	**90,000,000**	**20,280,000**	**34,000,000**	**1,750,000**	**146,030,000**

(ලකුණු 05)

සටහන්

1	**අයභාරය**	
	විකුණුම්	317,000,000

2	**විකුණුම් පිරිවැය**	
	විකුණුම් පිරිවැය	161,000,000

3	**වෙනත් ආදායම්**	
	වෙනත් ආදායම්	1,500,000
	ඉවත්කිරීම් ලාභය	3,250,000
	බොල්ණය ආපසු ලැබීම	1,400,000
	ස්ථාවර තැන්පතු පොලී ආදායම	250,000
	අඩමාණ ණය අධි වෙන්කිරීම (16,500 – 4,620)	11,880,000
		18,280,000

4	**පරිපාලන වියදම්**	
	පරිපාලන වියදම්	68,500,000
	ක්ෂය-ගොඩනැගිලි	720,000
	ක්ෂය-යන්ත්‍ර	6,000,000
	විගණන ගාස්තු	800,000
	ආදායම් බදු ගාස්තු	500,000
	කුලී වියදම්	900,000
		77,420,000

5	**බෙදාහැරීම් වියදම්**	
	බෙදාහැරීම් වියදම්	33,400,000
	ක්ෂය-මෝටර් රථ	3,000,000
		36,400,000

6	**මූල්‍ය වියදම්**	
	මූල්‍ය වියදම්	2,375,000

7	**ආදායම් බදු**	
	ආදායම් බදු වගකීම 23/24	12,450,000
	ගෙවීම්	(10,000,000)
	ගෙවිය යුතු ආදායම් බදු	**2,450,000**

8	**දිගුකාලීන ණය**	
	ඉදිරි වසරේ ගෙවිය යුතු	10,000,000
	ජංගම නොවන	40,000,000
	එකතුව	**50,000,000**

SRI LANKA

පෙර වැඩ

පොලී ප්‍රාග්ධනීකරණය	
ණය	50,000,000
අනුපාතය	15%
මාස 09 සඳහා පොලිය (50x.15x9/12)	**5,625,000**

යන්ත්‍ර හානිකරණය

යන්ත්‍ර ධාරණ අගය	36,000,000
අයකරගත හැකි අගය	34,000,000
හානිකරණ අලාභය	2,000,000

(ඉවත්කිරීමේ පිරිවැය අඩුකල පසු සාධාරණ වටිනාකම (රු. 30,000,000) භාවිතයට ගැනීමේ අගය (රු. 34,000,000) අගයන්ගෙන් වැඩි අගය)

මෝටර් රථ

ශේෂය	12,000,000	ඉවත්කිරීම	6,000,000
		ප/ගෙ/ශේෂය	6,000,000
	12,000,000		12,000,000
ඉ /ගෙ/ශේෂය	6,000,000		

aat SRI LANKA

මෝටර් රථ සමුච්චිත ක්ෂය

ඉවත්කිරීම	3,750,000	ශේෂය	5,000,000
		ක්ෂය	3,000,000
ප/ගෙ/ශේෂය	4,250,000		
	8,000,000		8,000,000
		ඉ /ගෙ/ශේෂය	4,250,000

මෝටර් රථ ඉවත්කිරීම

පිරිවැය	6,000,000
ප්‍රයෝජනවත් කාලය	4
ඉවත් කරන දිනට ප්‍රයෝජනවත් කාලය	2.5

මෝටර් රථ ඉවත්කිරීම

මෝටර් රථ	6,000,000	ශේෂය	5,500,000
ලාභය	3,250,000	මෝටර් රථ සමුච්චිත ක්ෂය	3,750,000
	9,250,000		9,250,000

ප්‍රාග්ධන නොනිමි වැඩ

ශේෂය	95,000,000		
මූල්‍ය වියදම්	5,625,000		
		ප/ගෙ/ශේෂය	100,625,000
	100,625,000		100,625,000
ඉ/ගෙ/ශේෂය	100,625,000		

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

ශේෂය	91,000,000	වෙළඳ ලැබිය යුතු දේ සඳහා දීමනාව	4,620,000
බොල්ණය අයකරගැනීම	1,400,000		
		ප/ගෙ/ශේෂය	87,780,000
	92,400,000		92,400,000
ඉ/ගෙ/ශේෂය	87,780,000		

ඉදිරියට කල ගෙවීම-කුලී

ශේෂය	3,600,000	ලා/ලා	900,000
		ප/ගෙ/ශේෂය	2,700,000
	3,600,000		3,600,000
ඉ/ගෙ/ශේෂය	2,700,000		

මූල්‍ය වියදම්

ශේෂය	8,000,000	ප්‍රාග්ධන නොනිමි වැඩ	5,625,000
		ලා/ලා	2,375,000
	8,000,000		8,000,000
			-

aat SRI LANKA

(මුළු ලකුණු 25)

නවවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 04 - මූල්‍ය හා මූල්‍ය නොවන දත්ත හා තොරතුරු අර්ථ දැක්වීම

(a)

(i) දළ ලාභ අනුපාතය

දළ ලාභ අනුපාතය = $\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100\%$

$$\frac{361,900}{1,683,700} \times 100 = \mathbf{21.49}\%$$

(ii) ශුද්ධ ලාභ අනුපාතය

ශුද්ධ ලාභ අනුපාතය = $\frac{\text{ශුද්ධ ලාභය}}{\text{විකුණුම්}} \times 100\%$

$$\frac{136,450}{1,683,700} \times 100 = \mathbf{8.10}\%$$

(iii) ණයගැති එකතු කිරීමේ කාලය

ණයගැති එකතු කිරීමේ කාලය = $\frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැති}} \times 365$ දින

පියවර 1: සාමාන්‍ය ණයගැතියන් ගණනය කිරීම

සාමාන්‍ය ණයගැති $\frac{541,500+419,800}{2} = 480,650$

පියවර 2: ණයට විකුණුම් ගණනය කිරීම

ණයට විකුණුම් $= 1,683,700 \times 60\% = 1,010,220$

පියවර 3: ණයගැති එකතු කාලය ගණනය කිරීම

$$\frac{480,650}{1,010,220} \times 365 = \mathbf{173}$$ දින

(iv) ණයහිමි පියවීමේ කාලය

ණයහිමි පියවීමේ කාලය = $\frac{\text{සාමාන්‍ය ණයහිමි}}{\text{ණයට ගැණුම්}} \times 365$ දින

aat SRI LANKA

පියවර 1: සාමාන්‍ය ණයහිමියන් ගණනය කිරීම

$$\text{සාමාන්‍ය ණයහිමියන්} = \frac{115,720+110,910}{2} = 113,315$$

පියවර 2: ණයට ගැනුම් ගණනය කිරීම

$$\text{ණයට ගැනුම්} = 1,321,800 \times 90\% = 1,189,620$$

පියවර 3: ණයහිමි පියවීමේ කාලය ගණනය කිරීම

$$= \frac{113,315}{1,189,620} \times 365 = \mathbf{35} \text{ දින}$$

(v) කොටසක ඉපැයුම (EPS)

$$\text{කොටසක ඉපැයුම} = \frac{\text{බදු පසු ශුද්ධ ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

$$\frac{136,450}{19,500} = 6.997 \text{ හෝ } 7.00$$

අනුපාත සාරාංශය:

අනුපාතය	වටිනාකම
දළ ලාභ අනුපාතය	21.49%
ශුද්ධ ලාභ අනුපාතය	8.10%
ණයගැති එකතු කිරීමේ කාලය	173.66 දින
ණයහිමි පියවීමේ කාලය	35 දින
කොටසක ඉපැයුම (EPS)	රු. 7.00

(ලකුණු 05)

(b)

අනුපාතය	ශක්ති පොදු සමාගම(2024)	කර්මාන්ත සාමාන්‍යය	විචලනය
දළ ලාභ අනුපාතය	21.49%	44%	කර්මාන්ත සාමාන්‍යයට වඩා 22.51% කින් පහළට
ශුද්ධ ලාභ අනුපාතය	8.10%	12%	කර්මාන්ත සාමාන්‍යයට වඩා 3.9% කින් පහළට
ණයගැති එකතු කිරීමේ කාලය	173.66 දින	105 දින	කර්මාන්ත සාමාන්‍යයට වඩා දින 68.66 ඉහළට
ණයහිමි පියවීමේ කාලය	34.77 දින	65 දින	කර්මාන්ත සාමාන්‍යයට වඩා දින 30.23 කින් පහළට
කොටසක ඉපැයුම (EPS)	රු. 7.00	රු. 7.50	කර්මාන්ත සාමාන්‍යයට වඩා රු. 0.50 කින් පහළට

විචලනයන් විශ්ලේෂණය:

1. **දළ ලාභ අනුපාතය (21.49% vs. 44% කර්මාන්ත සාමාන්‍ය)**

aat SRI LANKA

පැහැදිලි කිරීම:
ශක්ති පොදු සමාගමෙහි දළ ලාභ ආන්තිකය කර්මාන්ත සාමාන්‍යයට වඩා සැලකිය යුතු ලෙස අඩු වී ඇත, එයින් පෙන්නුම් කරන්නේ:

සමාගමට ඉහළ විකුණුම් පිරිවැයක් ඇති අතර, එය අකාර්යක්ෂම නිෂ්පාදනය, දුර්වල කේවල් කිරීම හෝ ඉහළ අමුද්‍රව්‍ය පිරිවැය නිසා විය හැකිය. තරඟකාරීව සිටීමට සමාගම නිෂ්පාදන මිල අඩු කරමින් සිටින අතර එමඟින් ලාභදායීතාවය අඩු වේ.

ගතහැකි ක්‍රියාමාර්ග:

නිෂ්පාදන පිරිවැය සමාලෝචනය කිරීම, වඩා හොඳ කේවල් කිරීම, නැතහොත් මිලකරණ උපාය මාර්ග ගවේෂණය කිරීම.

2. **ශුද්ධ ලාභ අනුපාතය (8.10% vs. 12% කර්මාන්ත සාමාන්‍ය)**

පැහැදිලි කිරීම:

ශුද්ධ ලාභ අනුපාතය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අඩු දළ ලාභය සහ ඉහළ මෙහෙයුම් හෝ පොලී වියදම් පැවතීම ය. විකුණුම් ශුද්ධ ලාභ බවට පරිවර්තනය කිරීමේදී සමාගම එතරම් කාර්යක්ෂම නොවේ.

ගතහැකි ක්‍රියාමාර්ග: ලාභදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා පරිපාලන පොදු කාර්ය පිරිවැය, පොලී පිරිවැය හෝ නිෂ්පාදන අකාර්යක්ෂමතා වැනි ක්ෂේත්‍ර විමර්ශනය කිරීම.

3. **ණයගැති එකතු කිරීමේ කාලය (දින 173 vs. දින 105 කර්මාන්ත සාමාන්‍ය)**

පැහැදිලි කිරීම:
කර්මාන්තයට සාපේක්ෂව ශක්ති පොදු සමාගමෙහි **ණයගැති** එකතු කිරීමට බොහෝ කාලයක් ගන්නා අතර, එමඟින් මුදල් ප්‍රවාහ ගැටළු සහ ඉහළ බොල් ණය ඇති විය හැක. මෙය දුර්වල ණය ප්‍රතිපත්ති හෝ අකාර්යක්ෂම ණය එකතු කිරීමේ ක්‍රියා පටිපාටි පෙන්නුම් කරයි.

SRI LANKA

ගතහැකි ක්‍රියාමාර්ග: දැඩි ණය කොන්දේසි ක්‍රියාත්මක කිරීම මගින් ණයගැති එකතු කිරීමේ කාලය අඩු කිරීම

4. **ණයහිමි පියවීමේ කාලය (දින 34.77 vs. දින 65 කර්මාන්ත සාමාන්‍ය)**

පැහැදිලි කිරීම:
සමාගම තම සැපයුම්කරුවන්ට කර්මාන්ත සාමාන්‍යයට වඩා අඩුකාලයක් තුල ගෙවන අතර එමඟින් ද්‍රවශීලතා ගැටළු ඇති විය හැකිය. සැපයුම්කරුවන් විසින් පිරිනමනු ලබන ණය කොන්දේසි සමාගම සම්පූර්ණයෙන්ම භාවිතා නොකරන බව ද එයින් ඇඟ වේ..

ගතහැකි ක්‍රියාමාර්ග:

කර්මාන්ත **සාමාන්‍යට** වඩා හොඳින් අනුගත වීමට සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට සැපයුම්කරුවන් සමඟ දිගුකාලීන ගෙවීම් කොන්දේසි සාකච්ඡා කිරීම

5. **කොටසක ඉපැයුම (EPS) (රු. 7.00 vs. රු. 7.50 කර්මාන්ත සාමාන්‍ය)**

පැහැදිලි කිරීම:
ශක්ති පොදු සමාගමෙහි කොටසක ඉපැයුම කර්මාන්තයේ සාමාන්‍යයට වඩා තරමක් අඩු වන අතර

එය අඩු ලාභදායිතාවය පිළිබිඹු කරයි. කොටසක ඉපැයුමට සෘජුවම බලපාන ශුද්ධ ලාභය අඩු වීම මෙයට ප්‍රධාන හේතුව විය හැකිය

ගතහැකි ක්‍රියාමාර්ග: පිරිවැය කළමනාකරණය සහ ආදායම් වර්ධනය තුළින් සමස්ත ලාභදායිතාවය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම

(ලකුණු 05)
(මුළු ලකුණු 10)

10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 05 (1 කොටස) - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන *(SLFRS-10)*
පරිච්ඡේදය 05 (2 කොටස) - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන *(SLFRS-10)*

(a)

සීමා සහිත Kanrich පොදු සමාගම අත්පත් කරගැනීම මත කීර්තිනාමය ගණනය කිරීම

අයිතමය	වටිනාකම (රු'000)
EN විසින් මාරු කරන ලද ප්‍රතිෂ්ඨාව (80%)	65,000
පාලනයට යටත් නොවන කොටස් හිමියන්ගේ සාධාරණ අගය (NCI) (20%)	20,000
මුළු මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව	**85,000**
අඩු: හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම (KN) (70,000+ 4,500)	(74,500)
අත්පත්කර ගැනීම මත කීර්තිනාමය	**10,500**

(b)

මාරු කරන ලද දේ.පි.උපකරණ වල ක්ෂය වීමේ බලපෑම

වසර 5ක් පුරා රු. 3,000,000ක් මත පදනම්ව KN ට මාරු කරන ලද දේ.පි.උපකරණ වල ක්ෂය විය.	600
වසර 5ක් පුරා රු. 2,000,000 මත පදනම් වූ මුල් ක්ෂයවීම.	400
KN විසින් අය කරන ලද අතිරික්ත ක්ෂයවීම්	**200**

රඳවාගත් ඉපැයුම්	
EN	26,900
කිර්තිනාම හානිකරණය	(6,000)
දේපල පිරියත උපකරණ විකුණුම් උපලබ්දි නොවූ ලාභ (3000-2000)	(1,000)
තොග මත උපලබ්දි නොවූ ලාභ	(240)
ගලපන ලද ලාභය	19,660
KN හි 80%	6,160
අවසාන ශේෂය	**25,820**

<u>පෙරවැඩ</u>

හානිකරණයට පසු කීර්තිනාමය

	වටිනාකම (රු'000)
හානිකරණයට පෙර කීර්තිනාමය	10,500
අඩු: හානිකරණය (EN හි රඳවා ගත් ඉපැයීම් වලින් අය කෙරේ)	(6,000)
හානිකරණයට පසු කීර්තිනාමය	**4,500**

KN - අත්පත් කර ගැනීමෙන් පසු ලාභය	
අත්පත් කර ගැනීමෙන් පසු ලාභය	7,500
ක්ෂය ප්‍රත්‍යාවර්ථ කිරීම	200
ගලපන ලද ලාභය	**7,700**
පාලනයට යටත් නොවන හිමිකම 20%	**1,540**
EN 80%	**6,160**

පාලනයට යටත් නොවන හිමිකම	
ආරම්භක පාලනයට යටත් නොවන හිමිකම (අත්පත්කර ගත් අවස්තාවේදී)	20,000
KN - අත්පත් කර ගැනීමෙන් පසු ලාභය	1,540
අවසාන ශේෂය (පාලනයට යටත් නොවන හිමිකම)	**21,540**

තොග මත උපලබ්දි නොවූ ලාභ	
KN විසින් මිලදී ගත් තොග	6,000
නොවිකිණී ඉතිරි වූ තොග (1/5)	1,200
20% පිරිවැය මත ලාභ අනුපාතය	**200**

සීමා සහිත Enrich සමූහය
2024/3/31 න් අවසන් දිනට
ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශය

	(රු.'000)
වත්කම්	
ජංගම නොවන වත්කම්	
දේපළ පිරියත උපකරණ (90,000 + 60,000 - උපලබ්දි නොවූ දේ.පි.උ රු. 1,000 + ක්ෂයවීම් ප්‍රත්‍යාවර්ථ කිරීම රු. 200)	149,200
කීර්ති නාමය (හානිකරණයට පසු)	4,500
මුළු ජංගම නොවන වත්කම්	**153,700**
ජංගම වත්කම්	
තොගය (12,000 + 18,000 - උපලබ්දි නොවූ ලාබ-තොග 240)	29,760
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (18,000 + 17,000)	35,000
මුදල් හා මුදල් සමාන දෑ (6,000 + 2,500)	8,500
මුළු ජංගම වත්කම්	**73,260**

මුළු වත්කම්	**226,960**
<u>හිමිකම් හා වගකීම්</u>	
<u>හිමිකම්</u>	
ප්‍රකාශිත ප්‍රාග්ධනය (EN පමණක්)	120,000
රඳවාගත් ඉපැයුම්	25,820
හිමිකම්	145,820
පාලනයට යටත් නොවන හිමිකම (NCI)	21,540
මුළු හිමිකම්	**167,360**
<u>ජංගම නොවන වගකීම්</u>	
සේවක ප්‍රතිලාභ (7,500 + 3,100)	10,600
මුළු ජංගම නොවන වගකීම්	**10,600**
<u>ජංගම වගකීම්</u>	
වෙළඳ ගෙවිය යුතු දෑ (32,000 + 9,050)	41,050
ගෙවිය යුතු ආදායම් බදු (6,600 + 1,350)	7,950
මුළු ජංගම වගකීම්	**49,000**
මුළු හිමිකම් හා වගකීම්	**226,960**

(මුළු ලකුණු 15)

C කොටසෙහි අවසානය

aat SRI LANKA

Notice:

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

SRI LANKA

© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)